**ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව** **දිනය - 2022.10.26** **වේලාව - පෙ.ව.9.00**

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා

2.ගරු උප සභාපති - ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3. ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා
4. කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 ජී.මී.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා
6. ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7. ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
8. ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9.එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
10. ඒ.ජී.තිලකරත්න මැතිතුමා
11.ඩී.ඒ.සුනිල් දෙයියාගල මැතිතුමා
12.පී.ඩබ්.අමිල හේමන්ත මැතිතුමා
13.එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
14.එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා
15.ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
16.ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා
17.ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
18.ටී.පී.ජී.කීර්තිසේන අල්විස් මැතිතුමා
19.එච්.ඒ.දිල්සානි ප්‍රශාදිකා මැතිනිය
20.කේ.මධුෂිකා ප්‍රශාදිනි ජයසිංහ මැතිනිය
21.එම්.ඩී.ඥානවති මැතිනිය
22.ටී.ඉමල්කා සංජීවනි මැතිනිය
23.බී.සීතා රංජනි මැතිනිය
24.ඒ.පී.ඩබ්ලිව්.එම්.ඩයනා උදයංගනි මැතිනිය

**සහභාගි වූ නිලධාරින්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා

2.සංවර්ධන නිලධාරි - ආර්.එච්.සී.නිසාන්ති සෙනවිරත්න මිය

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රිවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.නිමල් විජේසූරිය මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.සුදර්ශන් මැතිතුමා
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කමල්රාජ් මැතිතුමා
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහි කිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් පාලන ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සභිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්‍රිතුමන්ලා හට ,කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වී සිටින ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රිතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා.සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා ඔබතුමන්ලාගේ නොමඳ සහයෝගය ලබාදෙන ලෙස කාරුණිකව දන්වමි.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.09.27 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරිම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරිම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒම්.කේ.කේ සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, 2022.09.27 වන දින සභා වාර්තාවේ (ඌ)වෙනත් කරුණු යටතේ අංක 02 හි ගරු මන්ත්‍රිතුමන්ලාගේ අදහස් දැක්විමේ දී 21 පිටුවෙහි මාගේ අදහසේ දී "මේ වසර 05 තුළ යම්කිසි වැඩකොටසක් කළා.නමුත් සමහර දේවල් කෙරුන් නෑ ඒ ගැන අපි කනගාටු වෙනවා."යන සඳහන ඇතුළත් නොමැති බැවින් එය ඇතුළත් කිරිම සඳහන් විය යුතුය.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත ඉදිරිපත් කළ සංශෝධිත කරුණු සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසා සිටි ලදි.අතර සභාවේ නිහඬතාවයෙන් විරුද්ධත්වයක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2022.09.27 වන දින පැවති මහ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරිම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.09.27 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කරනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

*ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් වැඩිහිටි දින සැමරුම් උත්සවයක් 2022.10.27 වන දින පෙ.ව 9.00 ට පැවැත්වෙන බැවින් ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාට සහභාගී වන ලෙස දන්වා එවා ඇති බව දන්වමි.

*.පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/DE/01/09/03/2021/MR දරණ 2022.10.18 දිනැති ලිපිය මගින් ජනතා හිතකාමී කාර්යක්ෂම සේවාවක් වෙනුවෙන් මහජන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව තොරතුරු දන්වා ඇති බව නිවේදනය කරමි.

*. පහත නම් සඳහන් මහත්ම මහත්මීන් විසින් බදු ගැනීමට අපේක්ෂා කරන ලද පුරනැගුම කඩ කාමර සඳහා ගිවිසුම් ගතවීමට පෙර ගෙවිය යුතු 06 මාසික ආරක්ෂිත කුලී මුදල දින 14 ක් ඇතුළත අය කිරිමට කටයුතු කරන ලෙස දන්වා ලිපි නිකුත් කර ඇති බව නිවේදනය කරමි.
01.ඩී.එස්.කේ.ගුණසේකර කඩ කාමර අංක 06 (රු 66,000.00)
02.පී.එස්.විමලරත්න මහතා කඩ කාමර අංක 05 (රු.75000.00)
03.පී.එම්.කේ.ජයසේකර මහතා කඩ කාමර අංක 08 (රු.66,000.00)
04.ජේ.ගිරිදරන් මහතා කඩ කාමර අංක 03 (රු.114000.00)
05.ඩී.එස්.කේ.ගුණසේකර මහතා කඩ කාමර අංක (රු 66000.00)

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම**
**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**
**(ඉ) කල් දී ඇති යෝජනා**
**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජීව අබේකෝන් මැතිතුමා ඔබගේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** (ඉ) 01 නෙළුවතුකන්ද ග්‍රාමසේවක වසමේ නෙළුවතුකන්ද ග්‍රාමීය පාසල වසා දැම්මට කටයුතු සැකසෙමින් පවතින බැවින් එම කරුණ සම්බන්ධව සාකච්ඡාකොට පාසල යලි පටන් ගැනීමට ද ගුරුවරු දෙදෙනෙකු ලබා දී ,පාසල් ගොඩනැගිල්ලේ වහලය සාදා දී .ඉගෙනීමේ කටයුතු ආරම්භකර යලි පාසල පවත්වාගෙන යාමට කටයුතු සලසා ගැනිම සඳහා අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.පාසල වැසෙන්න දෙන්න බෑ. අදාල ආයතන ලිපි මගින් දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කරමු. අධ්‍යාපන ඇමතිතුමාටත් දන්වන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව අදාල ආයතන දැනවත් කිරිමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා ඔබගේ යෝජනාව ඉදිරිපත් කරන්න
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, (ඉ) 02.කිතුල්ගල උතුර තලගහබටේ සුමනගිරි විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිවන ආවාසගෙයි උළුවහු සහ ජනෙල් පියන් සඳහා සභාව වෙත ලබා දෙන රු.ලක්ෂ 1,50000.00 මුදලින් ඉටු කිරිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සීතා රංජනි මැතිනිය** ගරු සභාපතිතුමනි, සරත් මන්ත්‍රීතුමාගේ යෝජනාව ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ කළ හැකි එකක්.මගේ යෝජනාවටත් අනුමැතිය ලැබුන් නෑ.මෙය සංශෝධනය කරගන්න වානම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, (ඉ) 02 යෝජනාව වෙනුවට ඉහළ වටගල ගලපල්ල වත්ත මාර්ගයේ බෝක්කුව සංවර්ධනය කිරිම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව ඉහළ වටගල ගලපල්ල වත්ත මාර්ගයේ බෝක්කුව සංවර්ධනය කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඉහළ වටගල ගලපල්ල වත්ත මාර්ගයේ බෝක්කුව සංවර්ධනය කිරීම ලෙස ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 03. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් ඉටු කරන ලද කර්මාන්තවල බිල්පත් වටිනාකම ගෙවීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01.මහභාගේ ඉහල තුන්පැලබටේ මාර්ගයේ දුෂ්කර ස්ථාන සංවර්ධනය කිරීම - රු.499,779.94
02.මහවිල වෙරළුගොල්ල මාර්ගය සංවර්ධනය කිරීම - රු. 500,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 04. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කිරීමට යෝජනා කරන ලද පහත ව්‍යාපෘති වලට අදාළ ඇස්තමේන්තු සඳහා අනුමැතියත් අනුමත සමිතියක් මගින් ඉටු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01.ගල්පාත කඳුමුල්ල බෙරවලදෙණිය මාර්ගයේ කේ.ජී.අබේවර්ධන මහතාගේ නිවස අසල මාර්ගය සං.කිරීම - රු 150,000.00
02.තැලිගම සමෘද්ධි කාර්යාලය අසල මාර්ගය කොන්ක්‍රිට් කිරීම (සංශෝධිත) - රු.150,000.00
03.මීගස්තැන්න නො 05 මාර්ගය සංවර්ධනය කිරීම - රු150,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 05. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාල අයවැය කෙටුම්පත සම්බන්ධව සාකච්ඡා කිරීමට ගරු සභාපතිතුමාගේ යෝජනාව

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව ස්ථිර කරනවා.මෙම අයවැය කෙටුම්පත් වාර්තාව අධ්‍යනය කර තවත් සංශෝධන තිබේනම් ලිඛිතව ඉදිරිපත් කිරීමට සති දෙකක් තුළ මන්ත්‍රී අදහස් ලබා ගැනීමට කටයුතු සිදු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, අයවැය වාර්තාවේ අදහස් ලබා ගැනීමට සති දෙකක කාලයක් ලබා දෙන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව ඉදිරි සති දෙක තුළ මන්ත්‍රී අදහස් ලිඛිතව ලබා ගැනීමට ඉඩ තබා ඊට අනුකූලව සුදුසු වෙනස්කම් සිදු කර අයවැය ලේඛණය 2022 නොවැම්බර් මස මහ සභාවට යෝජනා කිරීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව ඉදිරි සති දෙක තුළ මන්ත්‍රී අදහස් ලිඛිතව ලබා ගැනීමට ඉඩ තබා ඊට අනුකූලව සුදුසු වෙනස්ක් සිදු කර අයවැය ලේඛණය 2022 නොවැම්බර් මස මහ සභාවට යෝජනා කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තිරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 06. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දීර්ඝ කාලීනව පවතින ඌන භාණ්ඩ වටිනාකම වන රු.80,544.48 ක් සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ලබා ගැනීමට 2022.05.20 දිනැති ගරු මහ සභාව මගින් පත්කළ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සලකා බැලීමට හා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. ඉදිරිපත් කර ඇති කමිටු වාර්තාව සලකා බැලීමේ දී එහි දක්වා ඇති කරුණු සත්‍යයි.එම නිසා මෙම ඌන භාණ්ඩ හා එම වටිනාකම ඉන්වෙන්ට්‍රි සම්බන්ධයෙන් කමිටු නිරිදේශ ක්‍රියාත්මක කිරීම කාලෝචිතයි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි අමිල හේමන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, G.I බට වගේ දේවල් කාර්යාලයට ලැබුණට කියක් ලැබුනද කියලා තහවුරුවක් නෑ අමාත්‍යාංශයෙන් තමයි එවලා තියෙන්නේ ,නමුත් දැනට වසර 4 ක සිට බට 368 ක ස්ථාවර ගානක් තියෙනවා.ඒක තමයි ඉදිරියට පවත්වාගෙන යා යුත්තේ ,අත්හැරිය යුතු දෑ ලේඛණ වලින් අත්හැරිමට කටයුතු සිදු කිරිම සුදුසු යැයි මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, කමිටු නිර්දේශ වල GI බට ගැන කියලා තියෙනවා.මේ බට ලේඛණවලට ඇතුළත් කළාට නිවරදිව ගණන් බලලා පොත්වලට ඇතුළත් කරන්නේ නෑ.ඒකයි යථාර්තය .වසර කීපයක සිට සභාවේ නිශ්චිත ගාණක් තියෙනවා.ඒ ප්‍රමාණය ලේඛණවලින් පවත්වාගෙන යාම ප්‍රමාණවත්.වෙන ආයතනයක වැරදි වහගන්න අපේ ලේඛණය වරද්ද ගන්න ඕන නෑ.ඔය ප්‍රශ්නයත් එහෙම එකක් කැඩිලා තැන් තැන් වලට මාරුකරලා තිබුනට විධිමත්ව කටයුතු නොකරපු හින්දා තාමත් පොත්පත් වල තියෙනවා.ඒ ඉලක්කම් මේ ඉලක්කම් වලට වටිනාකමක් නෑ .සත්‍ය ශේෂවලට ලේඛණ නිවරදි කරමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව අය කළ යුතු මුදල් අය කිරිමේ දි 25% ක දෙපාර්තමේන්තු ගාස්තුවක් සමඟ අය කිරිම සිදු කිරිමටත්,රු.18239.54 ක වටිනාකමින් යුත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඌනතාවය තවදුරටත් ලේඛනය තුළ පවත්වාගෙන යාම ප්‍රතිපලදායක නොවන බැවින් එම භාණ්ඩ හා එම වටිනාකම ඉන්වෙන්ට්‍රි ලේඛණයෙන් හා ගිණුම් ප්‍රකාශන වලින් ඉවත්කර කපා හැරිමටත්,කාර්යාලය සතු G.I බට ප්‍රමාණය 278 ක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය ලේඛණ සකස් කිරිම සිදු කිරිමටත් අපහරනය නිසි පරිදි සිදු නොවිම නිසා ලේඛණවල ශේෂයක් ලෙස ඉතිරිව පවතින ප්ලාස්ටික් පුටු 25 ලේඛණවලින් ඉවත් කිරිමටත් ඒවායේ වටිනාකම ලෙස රු .101,810.68 මුදල කපා හැරිමත් සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව අය කළ යුතු මුදල් අය කිරිමේ දි 25% ක දෙපාර්තමේන්තු ගාස්තුවක් සමඟ අය කිරිම සිදු කිරිමටත්,රු.18239.54 ක වටිනාකමින් යුත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඌනතාවය තවදුරටත් ලේඛනය තුළ පවත්වාගෙන යාම ප්‍රතිපලදායක නොවන බැවින් එම භාණ්ඩ හා එම වටිනාකම ඉන්වෙන්ට්‍රි ලේඛණයෙන් හා ගිණුම් ප්‍රකාශන වලින් ඉවත්කර කපා හැරිමටත්,කාර්යාලය සතු G.I බට ප්‍රමාණය 278 ක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය ලේඛණ සකස් කිරිම සිදු කිරිමටත් අපහරනය නිසි පරිදි සිදු නොවිම නිසා ලේඛණවල ශේෂයක් ලෙස ඉතිරිව පවතින ප්ලාස්ටික් පුටු 25 ලේඛණවලින් ඉවත් කිරිමටත් ඒවායේ වටිනාකම ලෙස රු .101,810.68 මුදල කපා හැරිමත් ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 06)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 07. අප සභාවේ සේවයේ නියුතු එම්.වී.කේ.අබේකෝන් මහත්මිය ආපදා ණය මුදලක් ඉල්ලුම් කර ඇත.(රු.145000.00 ) එම මුදල සභා අරමුදලින් ගෙවිම් කිරිම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාව

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 07)**

**හදිසි යෝජනා**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** **(ඉ) 08.** 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කිරිමට යෝජනා කරන ලද පහත ව්‍යාපෘති වලට අදාල ඇස්තමේන්තු සඳහා අනුමැතියත් අනුමත සමිතියක් මගින් ඉටු කිරිමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01.මත්තමගොඩ සුනිල් බේකරිය හරහා පරණ කොළණිය පාර සංවර්ධනය කිරිම - රු.150,000.00
02.නෙළුම්නාව යාය මාර්ගය කොන්ක්‍රීට් කිරිම - රු.100,000.00
03.ජයවින්දාගම ආනන්ද මහතාගේ නිවස අසලින් ක්‍රීඩාපිටිය දෙසට පිවිසෙන මාර්ගය සංවර්ධනය- රු.150,182.28

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** **(ඉ) 09.** ගෙවතු වගා සඳහා කාබනික පොහොර ලබා ගැනීම සම්බන්ධයෙන් කිතුලහේන ග්‍රාම සංවර්ධන සමිතියෙන් හා මහභාගේ වසමේ ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කමිටුවෙන් ඉල්ලිම් කර ඇත.ඒ අනුව කිතුලහේන ග්‍රාම සංවර්ධන සමිතිය සඳහා පොහොර කි.ග්‍රෑ.300 ක් හා මහභාගේ වසමේ ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කමිටුව සඳහා කි.ග්‍රෑ.700 ක ප්‍රමාණය ද නොමිලේ ලබා දීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** **(ඉ) 10.**යටියන්තොට ප්‍රාදේශිය සභාව මගින් සේවා සැපයීමේ දී සේවා ලාභීන්ගේ පහසුව සඳහා POS යන්ත්‍රයක් මගින් ගනුදෙනු කිරිමට සැලසුම් කර ඇත.අදාළ සේවාව ක්‍රියාත්මක කිරිම සඳහා මහජන බැංකුව ලබා දී ඇති කොන්දේසි අනුව සෑම ගනුදෙනුවක් සඳහාම 1% කොමිස් මුදලක් ගනුදෙනු කරු විසින් දැරීම හා සෑම මාසයකදීම රු 300000.00 ක ගනුදෙනු සිදු කිරිම හා එසේ නොවන අවස්ථා වලදි රු.2500.00 ක මුදලක් සභා අරමුදලින් ගෙවීම සිදු කළ යුතු වේ.
ඒ අනුව ඉහත සඳහන් කොන්දේසි වලට යටත්ව රු.300000.00 නොඉක්මවන ගනුදෙනු වලදි රු.2500 ක මුදලක් සභා අරමුදලින් දැරිමට හා ඉහත සේවාව යටියන්තොට ප්‍රාදේශීය සභාවෙහි ක්‍රියාත්මක කිරිම සඳහා සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. පවතින ආර්ථික තත්වය තුළ ජනතාව අතර මුදල් ගැවසෙන ප්‍රමාණය අඩුය.ඒ හේතුවෙන් සභාවේ ආදායම් රැස් කිරිමට ද බාධා ඇති වෙලා තියෙනවා.ඊට පිළියමක් ලෙස ණය කාඩ්පත් වලින් හෝ ආදායම් ලබා ගැනිමට හැකි බව මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, මුදල්මය ගනු දෙනුවකට වඩා මාර්ගගථ ගණුදෙනුවක් මගින් ගෙවීම්කරුවන් දිරිමත් කළ හැකි බව මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල හේමන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඩිජිටල් රාජ්‍යයක් සඳහා ඩිජිටල්කරණය වූ ආයතන පවත්වාගෙන යාම සඳහා රජය විසින් දියත් කර ඇති වැඩසටහනට මේ මගින් දායකත්වය ලබා දිය හැකි බැවින් මෙවන් සේවාවන් ව්‍යාප්ත කළ හැකි බව ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත (ඉ) 10 යෝජනාවට අනුව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 10 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** **(ඉ) 11.**2022.10.31 වන දින මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් ගරාගොඩ මුස්ලිම් විද්‍යාලයේ පැවැත්වීමට නියමිත වැඩසටහනට සමගාමීව කබුළුමුල්ල ළමා මිතුරු ආදර්ශ විද්‍යාලයේද පාසල් සිසුන් මූලික කරගනිමින් එවැනි වැඩසටහනක් පැවැත්වීමට සහ ඒ සඳහා රු.25000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 12. මෙම සභාවේ සේවා ගිවිසුම් මත සේවයේ නියුතුව සිටින වැඩ ක්ෂේත්‍ර කම්කරු ඩබ්.ඒ.ප්‍රියානි අනුරුද්ධිකා මිය හා බී.එච්.දුෂාන්ත කුමාර මයා සේවා ගිවිසුම් කාලය 2022.09.30 දිනෙන් අවසන් වේ.සේවා ගිවිසුම් දීර්ඝ කිරිම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.තවත් වසරක් දීර්ඝ කිරිම සුදුසු බවට මා ප්‍රකාශ කර සිටිනාවා

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව (ඉ) 12 සඳහන් මහත්ම මහත්මින්ගේ සේවා ගිවිසුම් කාළය 2023.09.30 දින දක්වා වසරක කාලයක් දීර්ඝ කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව ඉ) 12 සඳහන් මහත්ම මහත්මින්ගේ සේවා ගිවිසුම් කාළය 2023.09.30 දින දක්වා වසරක කාලයක් දීර්ඝ කිරිම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 12)**

**(ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**

01 .2022 සැප්තැම්බර් මාසයට අදාල වියදම් වාර්තාව
02. 2022 සැප්තැම්බර් මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව
03. 2022 සැප්තැම්බර් මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව
04. 2022 සැප්තැම්බර් මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව

**(ඌ) වෙනත් කරුණු**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගල්පාත එගොඩමුල්ල ප්‍රදේශයේ ජනතාව ගමන් ගන්නා රිටිගහඔය තොටුපල මාර්ගයේ ලී ඒ දඬු දෙක සහ ගල්පාත - ගොඩවෙල නාමල් ඇල හරහා ඇති ඒ දඬුව අළුත්වැඩියා කර ගැනිමට අවශ්‍ය වී ඇත.තව රිටිගහ ඔය වැකඩ පැරණි කොන්ක්‍රිට් පාලම කඩා වැටීමේ දී ඔයේ වැලි අතර සිර වී ඇති රේල් පීලි කීපය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සලසා ගැනිමට හා මාර්ග සංවර්ධන අධිකාරිය වැකඩ වැඩ ඒකකයේ භාවිතයෙන් ඉවත් කර ඇති යකඩ තහඩු අඩි පනහක් ලබා ගැනිමට මාර්ග සංවර්ධන අධිකාරිය වැකඩ වැඩ ඒකකයේ භාවිතයෙන් ඉවත් කර ඇති යකඩ තහඩු අඩි පනහක් ලබා ගැනිමට මාර්ග සංවර්ධන අධ්‍යක්ෂක ජනරාල්තුමාගේ අනුමැතිය ලබා ගැනිමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව දන්වමි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බංඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි,මත්තමගොඩ ශ්‍රී වාලුකාරාමයේ ඇති දහම් පාසල් ළමුන් සංඛ්‍යාව 500 ක් පමණ ඉගෙනුම ලබයි.විහාරස්ථානය අසල අවිස්සාවේල්ල කෑගල්ල මාර්ගයේ පදික මාරුවක් ඉදිකරන ලෙස ප්‍රාදේශිය සභාවේ මා මීට පෙර කථා කර ඇත.මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති නමුත් එය ක්‍රියාත්මක නොවිනි.එසේ හෙයින් නැවත වරක් මෙය මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරන මෙන් ඉල්ලමි.

*යටියන්තොට සීපෝත් මාර්ගය යටියන්තොට බල ප්‍රදේශයේ ප්‍රධානතම මාර්ගයයි.නගරයේ විශාල ආදායමක් ගෙන ඒම වගේම මගී ප්‍රවාහනය ,පාසල් රථ ප්‍රවාහනය,තේ දළු හා කුළු බඩු ප්‍රවාහනය කිරිමට අපහසු තත්වයක් පත්ව ඇත.මෙම ප්‍රදේශයේ පාසල් ළමුන්ට හා ගුරුවරුන්ට නියමිත වෙලාවට පාසලට යාමට නොහැක.වර්ෂ ගණනාවක සිට සංවර්ධන කටයුතු ඇණහිටි ඇති හෙයින් මේ පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි, මේ මාර්ගය පිළිබඳව කථා කළාට .පැලැම්පිටිය මාර්ගයේ ගමන් කරන ජනතාව චෝදනා කරනවා.මෙම මාර්ගයෙන් පාසල් ළමුන් ගුරුවරුන් වගේම ගාමන්ට් හා වෙනත් රැකියා සඳහා ජනතාව විශාල වශයෙන් ගමන් කරනවා.කුඩා කරුමාන්ත හිමියන්ටත් මෙය මහත් පීඩාවක් වෙලා තියෙන්නේ,මේ සම්බන්ධයෙන් විධායක ඉංජිනේරු කාර්යාලය දැනුවත් කරන්න.අපේ ගරු ප්‍රසාදිකා මැතිනියටත් මා දන්වා සිටිනවා මේ පිළිබඳව කටයුතු කිරිමට සහයෝගය දක්වන්න කියා .

**ගරු ප්‍රාදේශිය හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි,මේ මාර්ගය පිළිබඳව කථා කළ එක ගැන බණ්ඩාර මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා.මෙම මාර්ගයේ පාසල් බස් රථ 05 ක් පමණ ධාවනය කරනවා.ගාමන්ට් බස් රථ 05,දළු ලොරි 17 පමණ,පුද්ගලික බස් රථත් ධාවනයෙහි යෙදෙනවා.සීපෝත් පාසලට ගුරුවරුන්ට නියමිත වෙලාවට යන්න විදිහක් නෑ. මේ පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමාට දන්වන්න.ගරු ප්‍රසාදිකා මැතිනිය මේ පිළිබඳව සහයෝගයක් ලබා දෙන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි එච්.ඒ ප්‍රසාදිකා දිල්සානි මැතිනිය** ගරු සභාපතිතුමනි, මේ නම මාර්ග නඩත්තු ලේඛනයට දාලා තියෙන්නේ,මේ ගැටළුව පිළිබඳව අපි සාකච්ඡා පවත්වලා තියෙන්නේ ඉදිරියේද් සකස් කරගන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, මේ මාර්ගය සම්බන්ධව සියළුම දෙනා කථා කළා.මෙය සම්බන්ධිකරණ කමිටුවේ සාකච්ඡා කල යුතු කාරණයක් සභාපතිතුමා මේ පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධකරණයේදීත් කළා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.තිලකරත්න මැතිතුමා** ගරු සභාපතිතුමනි,මෙම සීපෝත් මාර්ගය පිළිබඳව අපි කථා කරනවා.නමුත් වැඩක් වෙන්නේ නෑ.නමුත් දැන් මේක ලොකු ගැටළුවක් වෙලා තියෙන්නේ.දැන් රටේ ඉන්න පාලකයින්ට කියලා වැඩක් නෑ.රට කරන්න පුළුවන් එකෙක් නෑ.මිනිස්සු ගොඩක් දුක් විදිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණ වැඩමුළුවක දි එක්තරා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් ගරු ජනාධිපතිතුමා සහ මාව විවේජනය කරලා තිබෙනවා.එම රැස්වීමේ දී එම කරුණ සම්බන්ධයෙන් කථා කිරිමට මට විනාඩි දෙකක් පමණ ලබා දෙන්න සභාපතිතුමා,මෙම මන්ත්‍රීවරයා ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාව සෑම අවස්ථාවකදීම විවේජනයට ලක් කරන බැවින් මෙය නවත්වන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.මොහුගේ ඉතිහාසය ගැන කියනවානම් යටියන්තොට කොට්ඨාශයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුජිත් සංජය පෙරේරා මැතිතුමාට හන්දියක් පාරක් ගානේ බැන වදිමින් යන විට මම මොහුව අත්දෙකින් අල්ලාගෙන සුජිත් සංජය පෙරේරා මැතිතුමා ගාවට එක්කන් ගිහින් ඔහුට භාර දුන්නා .නමුත් ඔහුව ප්‍රතික්ෂේප කළා. ඒ වෙලාවේ මාගේ බලවත් ඉල්ලීම මත ඔහුගේ වැඩකටයුතු වලට සම්බන්ධකර ගත්තා .මම කෙසේ හෝ සුජිත් සංජය පෙරේරා මැතිතුමා සම්බන්ධකර දුන්නා.නමුත් අද එම ආයුධයෙන්ම එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දය ඉල්ලලා මන්ත්‍රීවෙලා ගරු ජනාධිපතිතුමා විවේජනයට ලක් කරන්න මේ එක්සත් ජාතික පක්ෂ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කණ්ඩායමේ කේ.ජී.එස් ජයතිලක මැතිතුමා හැර අනෙක් සියළුම දෙනා සමගි ජන බල වේගයට උදව්කරන මන්ත්‍රීවරු. පක්ෂයේ අනෙත් සියළුම දෙනාට විනය පරික්ෂණ පවා තියෙනවා.නමුත් මම ඒවා දුරදිගට ගෙන ගොස් නැත.එම නිසා මා කියා සිටින්නේ ,ගරු ජනාධිපතිතුමාත් අපේ පක්ෂයේ නායකයිනුත් විවේජනය නොකර පක්ෂයෙන් ඉවත් වී මන්ත්‍රීධුරයත් තබා කරුණාකරලා වෙනත්

පක්ෂවලට උදව් උපකාර කරන අය ඉවත්ව යන ලෙස මා කරුණාවෙන් ඉල්ලා සිටින අතර මා හට හා ජනාධිපතිතුමාට යටියන්තොට කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂය නගා සිටිවීමට හැකියි.මෙතෙක් සමගි ජන බලවේගයට උදව් උපකාර කරනවානම් එම පක්ෂයටම ගිහින් කරගන්න.අපට අපේ පක්ෂය සාදා ගත හැකියි.මේ කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.තිලකරත්න මැතිතුමා** ගරු සභාපතිතුමනි,අපි ආය ඔයාලගේ පක්ෂයට උදව්කරන්නේ නෑ.අපි සමගි ජන බලවේගයට උදව් කරනවා.ජනාධිපත්තුමාට කියන්න හොරු අල්ලන්න කියලා එතොකොට අපි උදව් කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩයනා පාලමකුඹුර මැතිනිය** ගරු සභාපතිතුමනි,සීපෝත් මාර්ගයේ එන්න බෑ .ලොකු වළවල් තියෙනවා.ජයවින්දාගම සිට මල්පොල දක්වාම එන්නම අමාරුයි.මේ පිළිබඳව R.D හරහා විකල්පයක් හරි යොදන්න කියන්න.ABC හරි දාලා වළවල්ටික වහන්න කියන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු මන්ත්‍රීතුමනි,මේ පිළිබඳව අදාළ ආයතන දැනවත් කරන්න කටයුතු සිදු කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්ත හෙට්ටිකන්ද මැතිතුමා** ගරු සභාපතිතුමනි,තැලිගම රෝහල පහුකරලා යනකොට ලොකු වළලවල් තියෙනවා.මාහභාගේ මාර්ගයේත් යන්නම බෑ ප්‍රධාන මාර්ගයේ තැලිගමෙන් මෙහා හදන්න අදාළ ආයතනවලට ලිපියක් යොමු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි,මීට වර්ෂ ගණනාවකට පෙර සිය උදෑසන 06.00 ට පමණ තෙල්කුමුදුවල බස් නැවතුම් ස්ථානයේ සිට කොළඹ බලා ධාවනය ආරම්භ කළ ශ්‍රී ලංකා මහරගම ඩිපෝව ගල්පාත කොළඹ 138 බස් රථය මගින් ප්‍රදේශයේ ජනතාවට විශේෂයෙන්ම පාසල් සිසු දරු දැරියන්ට විශාල සේවයක් සැලසුනි.ගල්පාත තැබිලිවත්ත පාලම අබලන් වීම නිසාම බස් රථය තෙල්කුමුදුවලින් පිටත් වීම නවතා ගල්පාත ශ්‍රී සුමංගල විහාරස්ථානයේ අසල සිට උදෑසන 06.00 ට ආරම්භ කරයි.මෙම පාලම දැන් කාෆට් අතුරා අළුත්වැඩියා කර ඇති නිසා නැවතත් තෙල්කුමුදුවල සිට උදෑසන 06.00 ට බස් රථය ආරම්බ කර ගැනිමට අවශා කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිමි.

**01.නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා එච්.පී.ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා ,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කමල්රාජ් මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණිමට නොහැකි බව දන්වා සිටිනවා.එබැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා ,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කමල්රාජ් මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණිමට නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කරන බව ගරු මහ සභාවට මා දන්වා සිටිනවා

**02.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්ත හෙට්ටිකන්ද මැතිතුමා** ගරු සභාපතිතුමනි, තැලිගම රෝහලේ අයාලයේ යන ගවයින් කීපදෙනෙක් ඉන්නවා කියලා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි මා වෙත දන්වලා තියෙනවා.මේ හරක් අල්ලලා නිත්‍යානුකූලව භාරදෙන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම් සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,සීමා නිර්ණ කොට්ඨාශයට මහබාගේ වසමෙන් පාලනය වන මුඩුමහන කොටස මහභාගෙන් ඉවත් කරලා කළුකොහුතැන්න වසමට පවරලා දෙන්න පුළුවන්නම් හොඳයි.ඒක ජනතාවට ලොකු පහසුවක් කියලයි මම හිතන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්ත හෙට්ටිකන්ද මැතිතුමා** ගරු සභාපතිතුමනි, මුඩුමහන කොටස කළුකොහුතැන්න වසමට පවරන එකට මම විරුද්ධයි.මොකද ඒකේ ඉන්නේ ද්‍රවිඩ ජනතාව මේකට කැමති නෑ.මේ වතු සංවර්ධනය වෙලා නෑ.මේකට ඒඅයගෙන් අත්සන් කරලා ජනතාවගේ ඉල්ලිමක් එක්ක විශේෂ යෝජනාවක් ගේනන ඕන.

**ගරු උප සභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරුමැටිය මාර්ගයේ විදුලි බල්බ් ටික හදලා දෙන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි,ගරාගොඩ මුස්ලිම් විද්‍යාලයේ සහ කබුළුමුල්ල පාසලේ මත්ද්‍රා නිවාරණ වැඩසටහනක් තියෙනවා මේ මාසේ 31 වෙනිදා ඒ සඳහා සහභාගි වන මෙන් ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

***සභාපතිතුමාගේ ස්තුති කථාව**

අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්යය මණ්ඩලයටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් මාධයය ආවරණය සඳහා පැමිණි මහතාටත් ස්තුතිය පුද කරමින් ප.ව 2.15 ට පමණ මහ සභා රැස්වීම අවසන් කරන ලදි.